# තනි පද

***වචන කිහිපයක් වෙනුවට යෙදිය හැකි තනි වචන තනි පද නම් වේ.***

*උදා :-* අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

1) කොණ්ඩය කපන්නා - කරණවැමියා
2) කැම උයන්නා - අරක්කැමියා
3) ජලය නොමැති - නිරුදක
4) ලංකාවට අයත් - ලාංකික
5) කුඩාම ප්‍රමාණය - අවම
6) සපත්තු මසන්නා - සපතේරුවා
7) ගමෙහි වාසය කරන - ගැමියා
8) රජුට තුති ගී ගයන්නා - වන්දිභට්ටයා
9) පරපුරෙන් පරපුරට පැවත එන - පාරම්පරික
10) රත්තරන් වලින් කරන ලද - රන්මුවා
11) නළලට වැටෙන කෙස් රොද - කියඹුව
12) උස් බිමක ඇති තැනිතලා බිම - සානුව
13) තාපසයන් වාසය කරන ස්ථානය - අසපුව
14) තමන්ගේම ආරක්ෂාව - ආත්මාරක්ෂාව
15) නගරයෙන් මදක් දුරින් වූ ගම - පසල් දනව්ව
16) යකඩින් කරන ලද - අයෝමය
17) දැවයෙන් කරන ලද - දැව මුවා
18) රිදියෙන් කරන ලද - රිදී මුවා/රිදීමය
19) ගලින් කරන ලද - ශෛලමය